# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 394 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 07/03/2024<br>පැය 0830 |

## මාධ්‍ය නිවේදනය

**කල්පිටිය පොලිස් ස්ථානයේ හිටපු ස්ථානාධිපති රක්ෂිත බන්ධනාගාර ගත කිරීම - පුත්තලම විශේෂ කාර්යංශය.**

කල්පිටිය පොලිස් ස්ථානාධිපති එම පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරන ලද කාන්තා නිලධාරිණියකට ලිංගික අතවර කිරීමක් සම්බන්ධව 2024.01.29 වන දින පුත්තලම ගරු මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර තිබුණි. මේ සම්බන්ධව විමර්ශන සිදු කරන අතරතුර 2024.02.15 වන දින එම ස්ථානාධිපතිවරයාගේ රාජකාරි වැඩ තහනම් කිරීමට කටයුතු කර තිබූ අතර මෙම නඩු විභාගය 2024.03.06 වන දින පුත්තලම ගරු මහේස්ත්‍රාත් අධිකරණයේදී නැවත කැඳවීමෙන් පසු සැකකරුට ඇප ලබා දී ඇත.

මෙම හිටපු ස්ථානාධිපතිවරයා විසින් ඉහත නිලධාරිණියට පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීමට කරන ලද බලපෑමක් පිලිබඳව වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත යටතේ පුත්තලම ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවකට අදාලව 2024.03.06 වන දින එම නඩුව ගරු අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී හිටපු ස්ථානාධිපතිවරයා සම්බන්ධයෙන් ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව සැකකරු 2024.03.12 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කර ඇත.

කුලියාපිටිය කොට්ඨාසය භාර ජොෂ්ඨ පොලිස් අධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**